**කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සංවර්ධනය කිරීම උදෙසා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය - 2012**

-----------------------------------------------------------------------------------------------------------

**1. මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැර, මාගේ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2012 දෙසැම්බර් 31 දිනට වූ ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමෙහි නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව සහ

(ඉ) පසුගිය වසරේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් ප්‍රධාන සිද්ධීන් නිවැරදි කිරීම සඳහා සතුටුදායක වැඩ පිළිවෙලක් කළමනාකරණය විසින් ගෙන ඇති බව සහ

(ඊ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මූල්‍ය කාර්ය සාධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.1,551,325,620 ක් වූ අතර, 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.2,415,808,941 ක් විය. සමාලෝචිත වර්ෂයේ වියදම හා 2011 වර්ෂයේ වියදම සහ 2012 දෙසැම්බර් 31 දින සමුච්චිත වියදම පිලිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| සථාවර වත්කම් | 415,616 | 14,954,748 | 15,407,758 |
| සහභාගිත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් | 1,521,446,408 | 818,461,340 | 2,339,907,748 |
| මෙහෙයුම් වියදම් | 11,929,939 | 22,094,564 | 39,166,294 |
| පුහුණුවීම් සහ සංවර්ධන සහභාගීත්ව මූල්‍ය ආයතන | 17,533,657 | 3,793,484 | 21,327,141 |
| | 1,551,325,620 | 859,304,136 | 2,415,808,941 |

### 2.2 විශේෂ (ඩොලර්) ගිණුම

ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත්වලට හා ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලැබූ ඩොලර් ගිණුමේ මෙහෙයුම් සාරාංශ කර පහත දැක්වේ.

එ.ජ.ඩො. රු.

| | | |
|---|---|---|
| | ---------- | ---- |
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 22,219,700 | 2,530,852,743 |
| එකතුකළා<br>---------- | | |
| විදේශ විනිමය වාසිය | -- | 308,578,840 |
| | ------------- | ---------------- |
| | 22,219,700 | 2,839,431,583 |
| අඩු කළා<br>--------- | | |
| ආපසු ගැනීම් | (11,992,873) | (1,538,980,065) |
| | ------------- | ----------------- |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 10,226,827 | 1,300,451,518 |
| | ======== | ========== |

## 3. විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කෙරේ.

### 3.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2007 අගෝස්තු උපදේශකවරුන් තෝරාගැනීම සඳහා වූ මඟ පෙන්වීමෙහි 1.2 ජේදයට අනුව උසස් ගුණත්වයෙන් හා ප්‍රමිතියෙන් යුතු සේවයක් ලබා ගැනීම සඳහා සුදුසු පුද්ගලයෙකු උපදේශකයෙකු ලෙස බඳවා ගතයුතු වුවත් සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 87 ලබාගත් තැනැත්තා බඳවා ගෙන නොතිබුණි. මෙම තනතුර සඳහා සැම අතින්ම සුදුසු පුද්ගලයා මොහු බවට පිළිගෙන ඇතත් ඉල්ලා සිටි පාරිතෝෂිකය රජයේ චක්‍රලේඛ ප්‍රකාර ලබාදීමට නොහැකි බවට නිවැරදි නොවන අර්ථකතනයක් ලබාදී ඔහුව ප්‍රතික්ෂේප කර සම්මුඛ පරීක්ෂණයට කැඳවා නොතිබූ අවුරුදු 60 ට වැඩි පුද්ගලයෙකු උපදේශකවරයෙකු වශයෙන් බඳවා ගෙන තිබුණි.

### 3.2 කාර්ය සාධනය

---------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ණය ගෙවීම

-------------

ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා අනුමත කල ණය ප්‍රමාණයෙහි හා ගෙවීම් කළ ණය ප්‍රමාණයෙහි විස්තර පහත දැක්වේ.

| සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම | අනුමත කළ ණය ප්‍රමාණය | 2012 දෙසැම්බර් 31 දිනට ගෙවීම් කළ ණය ප්‍රමාණය | ගෙවීම් කල ණය ප්‍රමාණය අනුමත ණය ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | රු.මි. | රු.මි. | % |
| ලංකා බැංකුව | 492.75 | 336.66 | 68 |
| මහජන බැංකුව | 314.44 | 247.37 | 79 |
| කොමර්ෂල් බැංකුව | 479.56 | 322.57 | 67 |
| ඩීඑෆ්සීසී බැංකුව | 365.90 | 353.20 | 97 |
| ජාතික සංවර්ධන බැංකුව | 347.30 | 220.19 | 63 |
| ප්‍රාදේශිය සංවර්ධන බැංකුව | 261.85 | 168.69 | 64 |
| හැටන් නැෂනල් බැංකුව | 353.97 | 312.23 | 88 |
| සම්පත් බැංකුව | 415.70 | 379.00 | 91 |
| | 3,031.47 | 2,339.91 | 77 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉහත විස්තර අනුව ජාතික සංවර්ධන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව හා ලංකා බැංකුව විසින් ණය ලබාදීමේ ප්‍රගතිය අනෙකුත් බැංකු සමඟ සැසඳීමේදී අඩුමට්ටමක පැවති අතර එය පිළිවෙලින් 63%, 64%, 67%, හා 68% ක් විය.

(ii) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වෙත ණය නිදහස් කිරීමේදී හා ණය ලබාගැනීමේදී පහත දැක්වෙන අඩුපාඩු පැවති බව නිරීක්ෂණය විය.

i. ප්‍රති මුල්‍යානය කටයුතු සඳහා බැංකු වල ප්‍රමාදයන් පැවතීම.

ii. ණය උපයෝජනය සම්බන්ධයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට ප්‍රමාණවත් මඟ පෙන්වීමක් හා පුහුණුවක් ලබා නොදීම.

iii. සමහර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට ණය ලබාගැනීමේදී ප්‍රමාදයන් පැවතීම හා ණය ලබා ගැනීම අත්හැර දැමීම.

iv. විවිධ හේතු මත බැංකු විසින් ණය ලබාදීම අවලංගු කිරීම හා නව ව්‍යවසායන් සඳහා 2012 වර්ෂයේ අවසාන මාසයේ ණය අනුමත කිරීම සිදු කිරීම.

v. සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් විසින් ඉදිරිපත් කර තිබූ ව්‍යාපෘති යෝජනාව නිසි ඇගයීමකට ලක් කර ව්‍යාපාරික අවශ්‍යතා හඳුනා ගෙන ණය මුදල අනුමත නොකිරීම නිසා ණයමුදල නිදහස් කිරීමට නොහැකි වීම.

(iii) ණය අනුමත කිරීමෙන් පසු මාස 06 ක් ඇතුලත සියලුම ණය මුදල්වල ප්‍රථම වාරිකය නිදහස් කිරීමට අදාල පාර්ශවයන් විසින් එකගතාවයකට පැමිණ සිටියද එම කාලයද ඉක්මවා මාස 10 ක් ගතවී තිබුණ, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් දෙකක් වෙත නිදහස් නොකල ණය මුදල රු.මිලියන 26.5 ක් විය.

(ආ) පුහුණු කිරීම්

--------------

සහභාගීත්ව මුල්‍ය ආයතනවල නිලධාරින්ගේ සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ හැකියා ශක්තිමත් කිරීමට තාක්ෂණික සහාය ලබාදීම සඳහා වූ පුහුණුවීම් සිදු කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණක් වන අතර 2012 දෙසැම්බර් 31 දින දක්වා සිදු කරන ලද පුහුණුවීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සහභාගීත්ව මුල්‍ය ආයතනය | | | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් | | |
|---|---|---|---|---|---|
| සහභාගි වූ ප්‍රමාණය | එක් නිලධාරියකු | මුළු වියදම | සහභාගි වූ ප්‍රමාණය | එක් ව්‍යවසායකු | මුළු වියදම |

| | | සඳහා වියදම | | | සඳහා වියදම | |
|---|---|---|---|---|---|---|
| | ---------- | ----------- | ------- | ------------ | ------------ | ------- |
| | | රු. | රු. | | රු. | රු. |
| ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව | 563 | 4,848 | 2,729,189 | 1,167 | 1,450 | 1,692,520 |
| ප්‍රාදේශිය සංවර්ධන බැංකුව | 570 | 1,285 | 732,491 | - | - | - |
| ජාතික සංවර්ධන බැංකුව | 583 | 11,216 | 6,538,812 | 788 | 754 | 594,375 |
| ලංකා බැංකුව | 2,015 | 1,064 | 2,145,690 | 1,430 | 1,601 | 2,289,640 |
| කොමර්ෂල් බැංකුව | 152 | 1,373 | 208,711 | 644 | 388 | 250,077 |
| හැටන් නැෂනල් බැංකුව | 33 | 14,848 | 489,984 | 53 | 3,181 | 168,591 |
| මහජන බැංකුව | 204 | 12,064 | 2,461,037 | 425 | 1,072 | 455,503 |
| සම්පත් බැංකුව | 60 | 9,509 | 570,530 | - | - | - |
| | --------- | | ------------- | ------- | | ----------- |
| | 4,180 | | 15,876,444 | 4,507 | | 5,450,706 |
| | ===== | | ======== | ==== | | ======= |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන්වල මුදල් යෙදවීමට අදාලව සහභාගීත්ව මූල්‍ය ආයතනවල සහ එවැනි මුදල් යෙදවීම්වල ඵලදායි උපයෝජනය හා සම්බන්ධව එවැනි ව්‍යවසායන්වල ධාරිතාවය වර්ධනය කිරීම සඳහා රු. මිලියන 787 ක් ලෝක බැංකුව විසින් ලබාදීමට එකඟ වී තිබුණද එසේ රු.මිලියන 427 ක් පමණක් ලබාගැනිමට සහභාගීත්ව මූල්‍ය ආයතන එකඟ වී තිබුණි. 2012 දෙසැම්බර් 31 දිනවන විට මේ සඳහා ලබාගෙන ඇත්තේ රු. මිලියන 21 ක් පමණි. එය එකඟ වූ ප්‍රමාණයෙන් 5% ක් පමණක් විය.

(ii) 2012 වර්ෂයේදීද සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන්ට ලබාදී තිබුණු ණය මුදලින් වැඩිම මුදලක් එනම් රු.මිලියන 379 ක් සම්පත් බැංකුව විසින් නිදහස් කර තිබුණද සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත හිමිකරුවන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වා නොතිබුණ අතර, සම්පත් බැංකුවේ නිලධාරීන් සඳහා පුහුණු කිරීම් සිදු කර ඇතත් අනෙකුත් සහභාගීත්ව මූල්‍ය ආයතන හා සාපේක්ෂව අඩු නිලධාරීන් සංඛ්‍යාවක් පුහුණු කර තිබුණි.

(iii) ප්‍රාදේශිය සංවර්ධන බැංකුව විසින් තම ආයතනයේ නිලධාරීන් 570 ක් පුහුණුකර තිබුණද සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් පුහුණු කර නොතිබුණි.

(iv) හැටන් නැෂනල් බැංකුව හා මහජන බැංකුව පිළිවෙලින් තම ආයතනයේ නිලධාරීන් සහ සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් 53 හා 425 පුහුණු කර තිබුණ නමුත් අනෙකුත් සහභාගීත්ව මූල්‍ය ආයතන හා සාපේක්ෂව එය අඩු මට්ටමක පැවතුණි.

(v) සහභාගීත්ව මල්‍ය ආයතන අතරින් එක් බැංකු නිලධාරියෙකු පුහුණු කිරීම සඳහා දරන ලද අවම පිරිවැය ලංකා බැංකුව මගින් දරා තිබුණ අතර එය රු.1,064 ක් විය. උපරිම පිරිවැය රු.14,848 ක් වු අතර එය හැටන් නැෂනල් බැංකුව මගින් දරා තිබුණි. තවද එක් සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයකු පුහුණු කිරීම සඳහා අවම පිරිවැය රු.388 ක් කොමර්ෂල් බැංකුව මගින් දරා තිබුණ අතර රු.3,181 ක උපරිම පිරිවැය හැටන් නැෂනල් බැංකුව මගින් දරා තිබුණි. ඒ අනුව ඉහත දක්වා ඇති පරිදි විශාල වශයෙන් විචලනයන් පැවතීම පුහුණුවීම්වල ප්‍රමිතියක් සහ සැලැස්මක් නොමැති බව නිරීක්ෂණය කරනු ලැබේ.

(ඇ) ණය බෙදා හැරීම

------------------

(i) දිවයින තුල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හඳුනා ගනිමින් ණය පහසුකම් ලබාදීම ව්‍යාපෘතියේ අරමුණක් වුවත් කොළඹ, ගම්පහ, කුරුණෑගල යන දිස්ත්‍රික්කවලට වැඩි ණය ප්‍රමාණයක් මුදාහැර තිබුණි. අම්පාර, අනුරාධපුර, හම්බන්තොට, යාපනය, කිළිනොච්චිය, මොණරාගල, නුවරඑළිය, ත්‍රිකුණාමලය, වව්නියාව වැනි රටේ අනෙකුත් දිස්ත්‍රික්කවලට ලබාදී ඇති ණය ප්‍රමාණයේ වටිනාකම මුළු ණය වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස ගත් විට 0.02% ත් 1.54% ත් අතර පරාසයක විය.

මෙම ණය යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් දැනුවත් කර ගණුදෙනුකරුවන් තෝරා ගැනීමේ වැඩ පිළිවෙලක් නිසි අයුරින් ක්‍රියාත්මක නොවීමත් දිගු කාලයක් තිස්සේ ගණුදෙනු කරන විශ්වාසවන්ත ගණුදෙනුකරුවන් වෙත පමණක් මෙම ණය මදල් ලබා දීමත් නිසා ප්‍රතිලාභ සියළුම දිස්ත්‍රික්කවලට සමානුපාතිකව බෙදී ගොස් නොමැති බව නිරීක්ෂණ කෙරේ.

(ඈ) අවධානම් බෙදා ගැනීමේ පහසුකම් ඇති කිරීම

------------------------------------------------

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට ලබාදෙන ණය සම්බන්ධයෙන් වාණිජ බැංකුවලට ඇති විය හැකි අලාභයන්ගේ අවධානම අවම කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ සහභාගිත්ව මූල්‍ය ආයතන සහ ශ්‍රී ලංකා රජය ගිවිසුම් අත්සන් කිරීම ව්‍යාපෘතියේ ණය නිදහස් කිරීමේ ක්‍රියාවලියත් සමඟම කළ යුතු වුවත් 2011 වර්ෂයේ සිට නිදහස් කළ ණය සඳහා අවධානම් බෙදා ගැනීමේ පහසුකම ඇතිකර නොතිබුණි. දැනට මෙම ගිවිසුම නීතිපතිවරයා සමඟ සාකච්ඡා මට්ටමේ පවතින බැවින් ව්‍යාපෘතියේ සංරචකයක් වන අවදානම බෙදා ගැනීමේ පහසුකම මගින් වාණිජ බැංකු සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය ලබාදීමේ ප්‍රවණතාවය වර්ධනය කර ගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය කරනු ලැබේ.

(ඉ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය උපයෝජනයේ ප්‍රගතිය

---

මහජන බැංකුව සහ ලංකා බැංකුව මගින් ලබාදී තිබූ ණය උපයෝජනයේ ප්‍රගතිය නියැදියක් මගින් පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ණය මුදල ආයෝජනයෙන් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය ලාභදායි තත්ත්වයට පත්වුයේද යන්න පිළිබඳ පසු විපරම් කළ යුතු වුවද ණය ලබාදුන් අවස්ථා 29 කින් අදාල බැංකුව විසින් එවැනි පසුවිපරම් කර නිරීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණු අවස්ථා 08 ක් නිරීක්ෂණය විය. මෙහිදී ණය ලබාදීම මගින සමාජය හා ආර්ථික ප්‍රතිලාභ පුළුල් කර ගැනීමක් සිදුවී තිබුණිද යන්න තහවුරු කර ගැනීමක් ද සිදුකර නොතිබුණි.

(ii) සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත විසින් ලබා ගන්නා ණය මුදල සඳහා අනුමත කළ ව්‍යාපෘති යෝජනාව නිශ්චිත සැලසුම් ගත ව්‍යාපෘති යෝජනාවක් නොවීම නිසා මූල්‍යනය අවලංගු කළ අවස්ථා උද්ගත වී තිබුණි. අදාල බැංකුව විසින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හිමියා ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනාව නිසි ඇගයීමකට ලක්කර ව්‍යාපාරික අවශ්‍යතා හඳුනා ගෙන හා කර්මාන්ත හිමියා දැනුවත් කරමින් ණය මුදල අනුමත කලේ නම් මෙවැනි අවස්ථා ඇති නොවනු ඇත. එවැනි අවස්ථා 02 ක් පහත වේ.

- මිරිස් තුනපහ ඇඹරුම්හලක් සඳහා රු.මිලියන 4.3 ක් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා සහ රු.මිලියන 0.7 ක් කර්මාන්තයේ ආයෝජනය සඳහා වශයෙන් රු.මිලියන 5 ක් අනුමත කර තිබුණද පසුව එම කර්මාන්තයේ ආයෝජනය සඳහා රු.මිලියන 4.3 ක් හා රු.මිලියන 0.7 ක් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වශයෙන් වෙනස් කර ණය ලාභියා විසින් ණය මුදල ඉල්ලුම් කර තිබුණි. මේ නිසා අනුමත මුදලින් රු.මිලියන 0.7 ක් පමණක් මූල්‍යනය කර රු.මිලියන 4.3 ක මුදල මූල්‍යනය කිරීම අවලංගු කර තිබුණි.

- හැන්ඩ්ලුම් කර්මාන්ත ශාලාවන් සඳහා රු.මිලියන 2 ක් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා සහ රු.මිලියන 13 ක් යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම වශයෙන් රු.මිලියන 15 ක ණය මුදලක් අනුමත කර තිබුණද කාරක ප්‍රාග්ධන අවශ්‍යතා රු.මිලියන 2 ක් සහ එක් යන්ත්‍රයක් මිලදී

ගැනීම සඳහා රු.මිලියන 3 ක් වශයෙන් රු.මිලියන 5 ක් පමණක් නිදහස් කර තිබුණි. කර්මාන්ත හිමියා විසින් ඔහුගේ අතැති මුදල් වැය කර මිලදී ගත් යන්ත්‍ර සූත්‍ර සඳහා ඉතිරි ණය මුදල නිදහස් කරන ලෙස ඉල්ලා සිටියද ඒ වන විට මිලදී ගෙන තිබුණ යන්ත්‍ර සූත්‍ර සඳහා රු.මිලියන 10 ලබාදීම අවලංගු කර තිබුණි.

තවද 2012 ජනවාරි 20 දින රු.මිලියන 3.5 ක් වැය කර සවිකර තිබු යන්ත්‍රයද 2013 මාර්තු 19 දින වන විටත් ක්‍රියාකාර තත්ත්වයේ නොපැවතුණි.

(iii) මෙම ණය යෝජනා ක්‍රමයේ ලඟා කර ගැනීමට අපේක්ෂිත ප්‍රතිලාභ අතර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්වල ආර්ථික කටයුතු පුළුල් කිරීමේදී රැකියා අවස්ථා වර්ධනය කිරීමට ඉඩ සලසා දිය යුතු වුවද, ව්‍යාපෘති 04 ක කාර්ය මණ්ඩලය වැඩි කිරීමක් පිළිබඳ සැලකිලිමත් වී නොතිබුණි.

(iv) අදාල බැංකුව විසින් ලබාදුන් ණය මුදල් අදාල කාර්යය සඳහා යෙදවීමේ ප්‍රගතිය සඳහා ඉදිරිපත් කර තිබු ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාවලින් සත්‍ය ප්‍රගතිය වාර්තා කර නොතිබුණ අවස්ථා 03 ක් විය. මේ අතර අවස්ථා දෙකකදී යන්ත්‍ර මිලදී ගැනීමට පෙර මිලදී ගෙන තිබුණු බවටත් එක් අවස්ථාවකදී සේවක සංඛ්‍යාව 10 ක් ව සිටියදී සේවක සංඛ්‍යාව 15 ක් බවටත් සඳහන් කර තිබුණි.

(v) ලී බඩු කර්මාන්තශාලාවක් සඳහා යන්ත්‍ර මිලදී ගැනීම සඳහා රු.0.43 ක් ද කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා රු.මිලියන 9.5 ක් වශයෙන් රු.මිලියන 10 ක ණය මුදලක් ගෙවා තිබුණද කාරක ප්‍රාග්ධන අවශ්‍යතා ලෙස ලබා ගෙන තබු ණය මුදල ඒ සඳහා යෙදවුයේද යන්න තහවුරු කර ගත නොහැකි වු අතර මහජන බැංකු ශාඛාව මගින්ද එය තහවුරු කර ගෙන නොතිබුණි.

(vi) රබර් ඇඹරුම් කර්මාන්ත ශාලාවක් සඳහා රු.මිලියන 10 ක ණය මුදලක් අනුමත කර තිබුණි. එම මුදලින් ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 1.24 අදියර වශයෙන් නිදහස් කිරීමකින් තොරව 2013 ජනවාරි 13 දින මුළු මුදලම නිදහස් කර තිබුණි. නමුත් 2013 මාර්තු 18 දින වන විටත් එම ගොඩනැගිල්ල ඉදි කිරීමට ආරම්භ කර හෝ නොතිබුණි. තවද, අනුමත කර තිබු ණය මුදලට අනුව රු.මිලියන 1.36 ක් වටිනා ට්‍රක් රථයක් මිලද ගත යුතු වුවත්, එම රථය මිලදී ගෙන නොතිබුණි.

(vii) තාක්ෂණික නිලධාරියෙකුගේ තක්සේරු වාර්තාවක් ලබා නොගෙන ඇඟලුම් කර්මාන්ත ශාලාවකට පාවිච්චි කරන ලද මැෂින් මිලදී ගැනීම සඳහා රු.මිලියන 3 ක් අදාල ලංකා බැංකු ශාඛාව මගින් නිදහස් කර තිබුණි. මෙහිදී ජුකී මැෂින් 14 ක් හා ඕවලොක් මැෂින් 03 ක් මිලදී

ගෙන තිබුණද සේවකයින් 10 ක් පමණක් සේවයේ යොදවා ඇති බැවින් ඇතැම් මැෂින් අක්‍රියව පවතින බව නිරීක්ෂණය විය.

(viii) නිවාඩු නිකේතනයක් ආරම්භ කිරීම සඳහා රු.මිලියන 10 ක ණය මුදල යෝජිත ව්‍යාපෘතියට ආයෝජනය කර තිබුණද 2013 මාර්තු 22 දින වන විටත් ව්‍යාපාරික කටයුතු ආරම්භ කර නොතිබුණ අතර ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම පිළිබඳ නිශ්චිත බවක් ද නොවීය. එබැවින් මෙම ණය මුදල නිදහස් කිරීමෙන් ව්‍යාපෘතියේ අරමුණ වන සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හිමියකු දිරි ගැන්වීමක් සිදුවී නොමැති බව නිරීක්ෂණය විය.

(ix) නව කර්මාන්ත ඇති කිරීම සඳහා ණය ලබාදීම

---------------------------------------------------

ව්‍යාපෘතියේ අරමුණ වූ ලෝක ආර්ථික අවපාතය හේතු කොට ගෙන අර්බුදයට ලක් වූ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නඟා සිටුවීම සඳහා අළුතෙන් ආරම්භ කරන ලද ව්‍යාපාර 07 ක් සඳහා රු.මිලියන 237.15 ක ණය නිදහස් කර තිබුණ. මෙහිදී රු.මිලියන 10 ට වඩා ණය ලබාදීමේදී ගිවිසුමේ උපලේඛන 2 හි E (b) හි ඇතුලත් කොන්දේසි අනුව එම ව්‍යාපාරය ණය ලබාදීමේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීමට හැකියාවක් නොවීය.

(ඊ) ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්ය සාධනය

-------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම ව්‍යාපෘතියේ කළමනාකරණ ඒකකය, ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ ව්‍යාපෘතයේ ක්‍රියාකාරකම්වලටද සහාය විය යුතු අතර එම ව්‍යාපෘති ගිවිසුම 2012 ජුලි 17 දින අත්සන් කර 2012 වර්ෂය සඳහා රු.මිලියන 300 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුදු ඒ සම්බන්ධයෙන් මෙම වර්ෂය තුළදී කිසිදු කාර්යයක් සිදුකර නොතිබුණි.

(ii) ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය විසින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත 17 ක ස්ථානීය ක්ෂේත්‍ර පරීක්ෂණය කර ලබාදී තිබූ මුදල් ආයෝජනයේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර තිබුණද කර්මාන්ත 03 ක දක්වා තිබූ අඩුපාඩු සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග මොනවාද යන්න අනාවරණය කර ගෙන නොතිබුණි.